ගල්ගමුව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 15 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 04 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.4,000,000 ක් වූ බොබ් කැට් යන්ත්‍රයේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.1,390,345 ක මුදල දිගුකාලීන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඇ) දේශීය ණය සංවර්ධන අරමුදලේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, පුස්තකාල සහ සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා ලබාගත් ණය වෙනුවෙන් පසුගිය වර්ෂයට අදාළ පොලී රු.365,584 ක් ප්‍රවර්ථන වර්ෂයේ පොලී ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ රු.526,351 ක් වූ පොලී මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) ආදාහනාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ රු.584,234 ක් වූ පොලිය මූල්‍ය ප්‍රකාශනවල රු.586,123 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) JCB යන්ත්‍ර කුලියට දීමෙන් ලැබිය යුතු රු.217,913 ක ශේෂයක් හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමෙන් ලැබියයුතු රු.249,056 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) ඉදිරි වසර වෙනුවෙන් කලින් ලැබූ වරිපනම් රු.36,750 ක් හා ලැබිය යුතු වරිපනම් රු.239,806 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම්/ වත්කම් වශයෙන් වෙන් වෙන්ව හෙළිදරව් නොකර ගැලපීම් කර දක්වා තිබුණි.

(ඌ) ආදායම් අංශයෙන් ලබාගත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම රු.308,950 ක් වුවද, එය ආදායම් වියදම් ගිණුමේ රු.130,430 ක් ලෙස දක්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.103,950 ක් වූ හිඟ ආදායම ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(එ) හිඟ කඩ කුලී රු.838,349 ක් හා කලින් ලැබූ කඩ කුලී රු.35,654 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙන් වෙන්ව හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුරු.54,000 ක් වූ සම්ප්‍රේෂණ කුළුණු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මහවැලි අධිකාරිය යන ආයතන මගින් පිළිවෙලින් 20 ක් සහ 13 ක් වශයෙන් සභාවට පවරා දී තිබෙන සුසාන භූමිවල සහ ගලප්ජගම රුක්අත්තනයාගම ඉඩම යන ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඕ) සභාව සතු වාහන 03 ක වටිනාකම් තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ක) 2016 වර්ෂයේදී රු.115,000 කට මිලදී ගත් විදුලි ජල මෝටරය මූල්‍ය ප්‍රකාශනවල රු.1,015,000 ක් ලෙස සටහන් කර තිබුණි.

(ග) ගල්ගමුව පොදු වෙළඳපල සහ බස් නැවතුම්පල කඩ කාමරවලට අදාළව කඩ හිමියන්ගෙන් අයකරගත යුතු රු.205,635 ක හිඟ විදුලි ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මෝටර් ග්‍රේඩර් ණයගැති ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනය අතර රු.177,148 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ, බදු කුලී බිල් කිරීම් වටිනාකම දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී ලේඛනය සමඟ සැසඳීමේදී රු.12,808 ක වෙනසක් පැවතුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විවිධ තැන්පත් , විවිධ ණයහිමි හා පොදු සැපයීම් ශේෂයන් උපලේඛන සමඟ සැසඳීමේදි රු.2,112,870 ක වෙනසක් පැවතුණි.

(ඈ) සෞඛ්‍ය සේවා සඳහා වූ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු වියදම්, ලෙජරය අනුව රු.335,245 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ එය රු.3,352,245 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිපූර්ණය වියයුතු රු. 17,264,399 ක් වු වැටුප් රු.17,154,043 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ප්‍රවර්ථන වර්ෂයට අදාළව ප්‍රතිපූර්ණය විය යුතු වැටුප් , අදාළ ලේඛනය අනුව රු.52,332,675 ක් වූ නමුත් ආදායම් වියදම් ගිණුම අනුව එය රු.50,454,794 ක් විය.

(ඊ) සුභ සාධක සේවා යටතේ දක්වා ඇති වරෙන්තු ගාස්තු හා දඩ මුදල්, ලෙජරය අනුව රු.23,154 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව රු.231,154 ක් විය.

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව ජල සේවා ගාස්තුව රු.47,038 ක් වූ අතර ලෙජර ගිණුම් අනුව එම ශේෂය රු.67,038 ක් විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ලැබියයුතු ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට රු.70,779,071 ක් වූ ණයගැති ශේෂයෙන් රු.13,575,585 ක් වර්ෂ 1 - 5 ත් සහ වර්ෂ 5 ට වැඩි කාලයකට අදාළ විය. මින් රු.57,203,486 ක් වූ ණයගැති ශේෂයන් වෙනුවෙන් කාල විශ්ලේෂණයක්ද පිළියෙල කර නොතිබුණි.

(ආ) <u>ගෙවියයුතු ගිණුම්</u>

i. 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.87,354,339 ක් වූ අතර ඉන් රු.79,741,206 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

ii. වර්ෂ 2005 සිට 2015 දක්වා කාල පරාසයක් තුළ තැන්පත් කර තිබෙන ශේෂ 265 ක සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,862,974 ක් වූ මුදලින් ආපසු ගෙවිය හැකි තැන්පත් හඳුනාගෙන ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

iii. දීර්ඝ කාලයක සිට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,112,420 ක මුදල ගෙවා අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

-----------------------------------------

එකතු වටිනාකම රු.20,499,766 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ලේඛන සහ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම විෂයයන් පිළිබඳ විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | |
| 371 (2) | රු.74,000 ක තත්කාර්ය අත්තිකාරම් මාස 01 ත් 05 ත් අතර කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. |
| (ආ) <u>භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 චක්‍රලේඛය</u> | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 02 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.30,022,434 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.15,557,272ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,465,162 ක වර්ධනයක් සිදු වී තිබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

කුලී, වරෙන්තු ගාස්තු හා දඩ සහ වෙනත් ආදායම් පිළිවෙලින් රු.8,906,070 ක්, රු.4,772,060 ක් සහ රු.8,934,883 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 140 ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තුගත කර තිබුණද, රුපියල් මිලියන 105 ක් පමණක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 9 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 26 දක්වා වැඩි වී තිබුණි.

#### 2.3.2 වරිපනම් හා බදු

------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟය රු.203,057 ක් වූ අතර මෙම හිඟ වරිපනම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 32 – 42 දක්වා වූ රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.3.3 බදු කුලී

---------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු කුලී ශේෂය රු.957,773 ක් වූ අතර ඉන් රු.464,143 ක් 2009 සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාළ විය.

(ආ) ගල්ගමුව සතිපොලෙන් 2011 වර්ෂයට අදාළව අයවිය යුතු රු. 205,786 ක් සම්බන්ධයෙන් බදුකරු මාසිකව රු.5,000 බැගින් ගෙවීමට 2015 ජනවාරි 14 දින සිතාසි ලබාදී තිබුණද, නියමිත පරිදි මුදල් නොගෙවීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විටත් රු.183,786 ක් හිඟව පැවතුණි.

(ඇ) මහානාන්නේරිය සතිපොලේ 2011 වර්ෂයේ රු.30,805 ක් වූ හිඟ බදු මුදල් සම්බන්ධ නඩු තීන්දුවක් මත 2015 සැප්තැම්බර් සිට මාසිකව රු.6,000 බැගින් ගෙවීමට බදුකරුට නියම කර තිබුණද, 2016 සැප්තැම්බර් මස වන විට රු.6,000 ක් පමණක් අයවීම නිසා රු.24,805 ක් හිඟව පැවති අතර මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ගල්ගමුව නගරයේ කඩ කාමර 22 කින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයවිය යුතු රු.4,744,614 ක පෙර ගෙවුම් මුදල් වර්ෂ 04 ක කාලයක් තුල හිඟව පවතින අතර, අදාළ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) ගල්ගමුව පොදු වෙළඳපල ඉදිරිපිට ඉදි කරන ලද තහඩු කඩ කාමර 05 ක් 2015 ජූලි මාසයේදී ටෙන්ඩර් කර ලබාදී තිබූ අතර එයින් කඩ කාමර 03 කට අදාළ රු.126,600 ක් වූ ටෙන්ඩර් මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

### 2.3.4 වෙනත් ආදායම්

------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කුරුණෑගල - අනුරාධපුර මාර්ගය සහ සභා සීමාව තුළ 2016 ඔක්තෝබර් 18 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කටවුට් හා බැනර් සඳහා අයකළ යුතු ගාස්තුව රු.103,950 ක් වශයෙන් ගණනය කළ අතර එම මුදල් අයකර ගැනීමට සහ සභා සීමාව තුළ තිබෙන තවත් මෙවැනි ප්‍රචාරක දැන්වීම් හඳුනා ගැනීමට සහ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාබල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු 21 ක් පවතින බව වාර්තා වුවත්, මෙම කුළුණු ඉදි කිරීමේදී එක් කුළුණකට රු.200,000 බැගින් කුළුණු 18 ක් වෙනුවෙන් පෙරසැරි ගාස්තුව රු.3,600,000 ක් හා 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික සන්නිවේදන කුළුණු ආදායම රු.54,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් කඩ කාමර කුලියට දීමෙන් ලැබිය යුතු කඩ කුලිය නියමිත දිනට අයකර නොගැනීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත හිඟ කඩ කුලිය රු.802,695 ක් වූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (I) වගන්තියට අනුව එම මුදල් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගල්ගමුව බස් නැවතුම්පළ ගාස්තු අය කිරීම, 2013 හා 2014 වර්ෂවල සියයට 40 ක කොමිස් පදනම මත පුද්ගලයෙකු මගින් කරමින් සිටියදී 2015 වර්ෂයට ටෙන්ඩර් කැඳවා එම පුද්ගලයාටම රු.1,605,750 කට ලබාදී තිබුණි. මෙහිදී 2013 හා 2014 වර්ෂවල සභාවට ලැබී තිබූ ආදායම පිළිවෙලින් රු.689,010 ක් හා රු.660,000 ක් වීම නිසා එම කාලයට විශාල ආදායමක් අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. තවද 2016 වර්ෂයට ටෙන්ඩර් කිරීමේදී රු.1,300,575 කට ලබාදී තිබූ බැවින් 2015 ටෙන්ඩර් මුදල් සැලකිල්ලට නොගෙන 2016 අවම ලංසුව තීරණය කිරීම නිසා 2016 වර්ෂයට අඩු මුදලක් ලැබී තිබුණි.

(ආ) සභාවේ සේවා නියුක්තව සිට විශ්‍රාම ගිය/ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකු තැන්පත් කළ ඇප මුදල් හා ඊට අදාළ පොලී සමග එකතුව රු.13,582 ක් ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු වීම හා සේවය හැරයාම වැනි හේතු මත අය නොවන රු.23,558 ක් වූ සේවක ණය ශේෂය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) දැනට සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවෙකුට 2015 දෙසැම්බර් 28 දින රු.150,000 ක ආපදා ණය මුදලක් ගෙවා තිබුණු අතර 2016 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලයට අදාළව ණය වාරික රු.42,207 ක් හා පොලී රු.4,642 ක් අදාළ ණයකරුගේ මාසික වැටුපෙන් අයකර ගැනීමට 2016 ඔක්තෝබර් අවසානය වන විටද පියවර ගෙන නොතිබුණි.

(ඉ) ගල්ගමුව පොදු වෙළඳපල හා බස්නැවතුම්පල කඩ කාමරවලට අදාළ විදුලි බිල් වටිනාකම් කඩ හිමියන්ගෙන් අයකර ගැනීමේ පදනම මත මාසික විදුලි බිල්පත් සභාව විසින් ගෙවා තිබුණද, කඩ 23 කට අදාළ විදුලි බිල්පත් එකතුව වූ රු.205,635 ක් කඩ හිමියන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගල්ගමුව මහජන පොළ පිහිටි ගොඩනැගිල්ල අඩි 8x6 සහ අඩි 7x5 කොටස් 442 කට වෙන්කර තිබූ අතර එයින් කොටසක් ආවරණය වන පරිදි තාවකාලික කඩ කිහිපයක් පවත්වාගෙන යාම හේතුවෙන් පොළට ඇතුළුවන ස්ථානයෙන් දකුණු පස පිහිටි කොටස් කිහිපයක් භාවිතයට ගැනීමට නොහැකි වීම නිසා ලබාගත හැකි ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) ගල්ගමුව මහජනපොළ ගොඩනැගිල්ල තුළ පිහිටි කොටස් 442 න් එක් පොළ දිනකදී අවම වශයෙන් එක් කොටසකින් රු.200 බැගින් රු.88,400 ක ආදායමක් ලැබිය යුතු වුවත් 2016 ඔක්තෝබර් 18 දින සිදු කළ විගණන පරීක්ෂාවේදී ගොඩනැගිල්ල ඇතුළත කොටස්වලින් රු.60,140 ආදායමක් පමණක් රැස්කර තිබුණි.

**3.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතුව පවතින වාහන 04 ක් වසර 1-5 දක්වා අතර කාලයක සිට නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ආ) ගල්ගමුව පොදු වෙළඳපල කඩ කාමර 08 ක් 2016 වර්ෂය සඳහා සුදුසු පදනමක් මත බදු හෝ කුලියට ලබා නොදීම නිසා 2017 අප්‍රේල් මාසය වන විටද එම දේපළ වලින් කිසිදු ආදායමක් සභාවට ලැබී නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව යෝජිත වූ රු.1,950,000 ක් වටිනා සහා කර්මාන්ත 05 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඇස්තමේන්තු මුදල රු.4,003,286 ක් වූ මාර්ග සංවර්ධන කර්මාන්ත 03 ක් 2017 ඔක්තෝබර් මාසය වන විට ක්‍රියාත්මක කරමින් පැවති අතර ඒ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

i. මෙම කර්මාන්ත තුන සඳහා මිල ගණන් කැඳවා නොතිබූ අතර කොන්ත්‍රාත්කරුවන් හට දුරකතන මගින් දැනුම් දී මිල ගණන් ලබාගෙන තිබුණි. මිල ගණන් කැඳවීමේදී ලංසුකරුවන්හට සාධාරණ කාලයක් ලබාදිය යුතු වුවද, දින තුනක කාලයක් පමණක් ලබාදී තිබුණි. එබැවින් නිසි තරඟකාරීත්වයක් ඇතිවීමට ඇති ඉඩකඩ වැලකී තිබූ අතර කර්මාන්ත තුන සඳහා එක් ලංසුකරුවෙකු මගින් පමණක් මිල ගණන් ලබාගෙන අදාළ කොන්ත්‍රාත් ලබාදී තිබුණි.

ii. කර්මාන්ත සඳහා ඇස්තමේන්තු සැකසීමේදී කර්බ්වල කොන්ක්‍රීට් සඳහා රු.292,186 ක් වුවද, කර්බ් සඳහා හැඩයම් යෙදීමට රු.335,988 ක් ඇස්තමේන්තු කර තිබුණි. ඇස්තමේන්තු සැකසීමේදී මුළු මාර්ගයේම කර්බ් එකවර හැඩයම් යෙදීමට හා අදාල ලෑලි එක් වරක් භාවිතා කිරීමේ පදනම මත ඇස්තමේන්තු සකසා ඇතත් කොන්ත්‍රාත්කරුවන් විසින් මීටර් 20 ක 30 ක පමණ කොටසක් පමණක් එකවර හැඩයම් යොදන බව හා එකම ලෑලි අවස්ථා කිහිපයකදී භාවිතා කරන බව 2016 ඔක්තෝබර් 20 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

2016 වර්ෂයේදී ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.13,408,147 ක වියදමක් දරා තිබූ අතර කාබණික පොහොර ටොන් 3600 ක් නිෂ්පාදනය කර එම නිෂ්පාදන අලෙවියෙන් රු.256,544 ක් උපයා තිබුණි. තවද 2015 වර්ෂයේදී අපද්‍රව්‍ය කළමනාකරණය, ඇතුළු පරිසර හිතකාමී කාර්යයන් සම්බන්ධයෙන් සභාවට "හරිත සම්මාන - 2015"නමැති සම්මානය ලැබී තිබුණි.

## 04 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

## 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක හා වියදම් විෂයයන් 8 ක අයවැයගත හා සත්‍ය සංඛ්‍යා අතර සියයට 21 සිට සියයට 84 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයක් පැවති අතර විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත සඳහා රු.679,000 ක ප්‍රතිපාදන වෙන්කර රු.3,139,445 ක් වැයකර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදවාගෙන නොතිබුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 05. පද්ධති හා පාලනය

----------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දූර්වලතාවයන් වරින් වර ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ස්ථාවර වත්කම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>දේශීය ණය සංවර්ධන අරමුදල් හා පොලී වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>සටහන් කිරීමේ දෝෂ.<br>ජංගම වගකීම් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |

| | |
|---|---|
| | හෙළිදරව් කිරීමේ දෝෂ.<br>ජංගම වත්කම් අඩුවෙන් ගිණුම්ගත කිරීම.<br>ආදායම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>ලේඛන හා උපලේඛන අතර වෙනස්කම්.<br>ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) ආදායම් පාලනය | ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් භාවිතයට ගැනීමේදී ඇති වූ අකාර්යක්ෂමතා හා නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් පැවතීම. |
| (ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | කර්මාන්ත සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ හා ඇස්තමේන්තු සකස් කිරීමේ දෝෂ පැවතීම. |